# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2345/64 - 2023 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2023.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වන වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *I වන තීරය* | | | | *II වන තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1. | 10.05 | 1005.90 | බඩ ඉරිඟු | කි.ග්‍රෑමයකට රු. 25 |
| 2. | 07.13 | | උඳු : | |
| | | 0713.31.22 | පිට කුරුට්ට ඉවත් කළ, පියළි කළ හෝ පියළි නොකළ | කි.ග්‍රෑමයකට රු. 300 |
| | | 0713.31.29 | අනෙකුත් | කි.ග්‍රෑමයකට රු. 300 |
| 3. | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි.ග්‍රෑමයකට රු. 300 |

2. ඉහත දක්වා ඇති බඩ ඉරිඟු, උඳු හා මුං ඇට ආනයනය කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශය මත සිදු කළ යුතු ය.


1A - PG 6452 — 431 (2023/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලදුව පහත දැක්වෙන *අතිවිශෙෂ ගැසට්* නිවේදන මගින් ප්‍රකාශයට පත්කළ නියමයන් 2023 අගෝස්තු මස 18 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරනු ලැබේ ;

(i) උඳු (සං. ව. සංකේතාංක 0713.31.22 සහ 0713.31.29) ආනයනයට අදාළ 2023 මාර්තු 04 දිනැති අංක 2321/76 දරන *අතිවිශෙෂ ගැසට්* නිවේදනය ;

(ii) මුං ඇට (සං. ව. සංකේතාක 0713.31.19) ආනයනයට අදාළ 2022 ඔක්තෝබර් 13 දිනැති අංක 2301/40 දරන *අතිවිශෙෂ ගැසට්* නිවේදනය .

4. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, 2023 අගෝස්තු මස 18 වැනි දින සිට ආරම්භ වන මාස 6ක කාලසීමාවක් සඳහා මෙම නියමය වලංගුව පැවතිය යුතු ය.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 08 - 0207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.